දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :08/2024

මගේ අංකය- සමු/අධි/CCD/01
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව(බ.ප),
ආදිපාද වීදිය, කොළඹ 01.
2024.09. 30

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සංවර්ධන නිලධාරීන් වෙත.

<u>බස්නාහිර පළාතේ සමුපකාර සමිති වර්තමානයේ මුහුණ දී ඇති අර්බුදකාරී පසුබිම සම්බන්ධවයි</u>

බස්නාහිර පළාත තුල ක්‍රියාත්මක වන සමුපකාර සමිති වල මූල්‍ය තත්ත්වය පිළිබඳව අවධානය කිරීමේදී සැලකිය යුතු සමිති ප්‍රමාණයක මූල්‍ය තත්ත්වය අයහපත් බව නිරීක්ෂණය වේ. මහජන තැන්පතු (සාමාජික හා සාමාජික නොවන තැන්පතු) විශාල ප්‍රමාණයක් මෙම සමිතිවල ආයෝජනය කර ඇති බැවින් අදාල තැන්පත් මුදල් වල ආරක්ෂාව සහතික කිරීම හා මෙකී සමිති ශක්තිමත් මූල්‍ය මට්ටමකට පත් කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් වී ඇත. එකී ක්‍රියාවලියේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටු කල යුතු බව පෙන්වා දෙමි. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් මට්ටමේ රාජකාරි කාර්යභාරය හා වගකීම ඉටුකරන සමුපකාර සංවර්ධන නිලධාරියාගේ කාර්යක්ෂමතාවය වර්ධනය කරමින් සේවා තත්ත්වය උසස් කිරීම සඳහා මාගේ 2015.11.13 දිනැති අංක 2015/02 චක්‍ර ලේඛය නිකුත් කර ඇත.

02. ඒ අනුව එම චක්‍ර ලේඛයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ අවධානය යොමු කරවන අතර එයට අමතරව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්ද නිලධාරීන්ගේ විශේෂ අවධානය යොමු කල යුතු බව දන්වමි.

1. සමිතියේ අවශ්‍යතාවය පරිදි සමිතියේ සංවර්ධන සැලැස්ම හා අයවැය ඇස්තමේන්තු සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම ලබා දීම හා සංශෝධන අනුමත වීමකින් තොරව ක්‍රියාත්මක නොකරන ලෙස මඟපෙන්වීම ලබාදීම.

2. අතුරු ව්‍යවස්ථානුකූලව සමිතියේ පරමාර්ථ වලට හා සමිතියට හිමි බලතල වලට අනුකූල වන කාර්යයන් වලට පමණක් සමිති අරමුදල් යෙදවීමට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දීම.

3. සමස්ත සමිතියේ හා ඒ ඒ අංශවල ගිණුම් අනුව අලාභ තත්ත්වයන් වාර්තා වන්නේ නම් එයට බලපා ඇති හේතු ඊට යම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් වගකිව යුතු නම් එසේ වගකිව යුතු පුද්ගලයන් හා සිදු වී ඇති අලාභය හඳුනා ගැනීම හා වාර්තා කිරීම සහ එකී තත්ත්වයන් නිවැරදි කර ගැනීම සඳහා මඟ පෙන්වීම් ලබා දීම.

4. සමිති මුදල් ආයෝජන සිදු කිරීමේදී 01/2024 අංක දරණ 2024.05.15 චක්‍ර ලේඛය අනුව කටයුතු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දීම හා පසුවිපරම් සිදු කිරීම.

5. ද්‍රවශීලතා වාර්තා, මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තා, කල් පසු ණය වාර්තා ,වත්කම් වගකීම් පිළිබඳව වාර්තා නියමිත දිනට නිවැරදිව පිළියෙල කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයට/ කාරක සභාවට ඉදිරිපත් කරවීමටත් අවශ්‍ය පරිදි සමිති මෙහෙයවීම.

6. ඉහත සඳහන් වාර්තා සමාලෝචනය කර සමිතියේ තත්ත්වය පිළිබඳවත් ඉදිරියේදී කටයුතු සිදු කල යුතු ආකාරයත් පිළිබඳවත් සමිතිය දැනුවත් කිරීම.

7. සමුපකාර රීති, චක්‍රලේඛ, අතුරු ව්‍යවස්ථා අනුව අනුමත කරන ලද පිටණය සීමා පවත්වාගෙන යාමටත් එකී පිටණය සීමාව ඉක්මවා නොයන පරිදි සාමාජික නොවන තැන්පතු රැස් කිරීමටත් මඟපෙන්වීම් ලබා දීම.

8. සෑම විගණනයක් සඳහාම ජංගම ගොනුවක් පවත්වා ගෙන යා යුතු අතර, අදාළ සමිතිය සම්බන්ධයෙන් විගණකවරයාගේ අනාවරණය කිරීම් අනිවාර්යයෙන් සිදුකල යුතු අතර එකී සෑම අනාවරණය කිරීමක්ම පැහැදිලිව හා නිශ්චිතව ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

9. විගණන සිදු කිරීමේදී වංචාවක්, අවභාවිතාවක්, අක්‍රමිකතාවක් හෝ යම් ගැටළු සහිත තත්ත්වයක් අනාවරණය වන්නේ නම් ඒ සම්බන්ධව වහාම වාර්තාවක් සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර අවශ්‍ය පරිදි තවදුරටත් කාලය ලබා ගෙන විගණන කටයුතු සිදුකල යුතුය.

10. විගණනය සඳහා සමිතිය විසින් පොත්පත් හා ගිණුම් ඉදිරිපත් නොකරන්නේ නම් 2023.09.15 දින 11/2023 අංක දරණ චක්‍ර ලේඛය පරිදි කටයුතු කළ යුතු අතර, එබදු අවස්ථාවක හැර වෙනත් කිසිදු හේතුවක් මත විගණනය සිදු කිරීම අත් හිටුවීම හෝ නතර කිරීම නොකළ යුතුය.

11. සෑම සමිතිභාර සමුපකාර සංවර්ධන නිලධාරියෙකුම සමිතියේ මුදල් වර්ෂය අවසන්ව මාස 02 ඇතුලත විගණනයට සුදානම පිළිබඳව වාර්තාවක් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

12. තමන් භාරයේ ඇති සමිතිවල අවදානම් ණය ප්‍රතිශතය 20% හෝ එම අගය ඉක්මවයි නම් තවදුරටත් ණය නිකුත් කිරීම අත්හිටුවීමටත් අවදානම් ණය අයකර ගැනීම සඳහා විශේෂ වැඩසටහන් සකස් කර අවදානම් ණය ප්‍රතිශතය 20%ට වඩා අඩු වූ විට නැවත ණය නිකුත් කිරීම ආරම්භ කිරීමටත් සමිති මෙහෙයවීම.

13. බස්නාහිර පළාතේ සමුපකාර සමිති ප්‍රඥප්තිය හා මා විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස් වලට විධිවිධාන වලට අනුකූල නොවන පරිදි අවධානම් සහිත ආයෝජන සිදු නොකිරීමටත් එබඳු ආයෝජන පවතින්නේ නම් වහාම අදාල මුදල් සමිතිය වෙත ලබා ගැනීමටත් සමිතිය මෙහෙයවීම.

14. මූල්‍ය සේවා සමුපකාර සමිතිවල තැන්පත් හා ණය පොලී අනුපාත අතර පරාසය අතුරු ව්‍යවස්ථාවෙන් නියමකර ඇති පරාසය ඉක්මවා නොයන ලෙස කටයුතු කිරීමට සමිති මෙහෙයවීම.

15. මූල්‍ය සේවා සමුපකාර සමිතිවල මූල්‍ය සේවා අංශයට අමතරව වෙනත් ව්‍යාපාරික අංශ ක්‍රියාත්මක වන්නේ නම් එකී වෙනත් ව්‍යාපාරික අංශ සඳහා මූල්‍ය සේවා අංශයයේ මුදල් භාවිතා නොකර කටයුතු කිරීමට සමිති මෙහෙයවීම.

16. සමුපකාර සමිති ප්‍රඥප්තියේ 44, 46 හා 47 වගන්තිය යටතේ සිදු කරනු ලබන විගණන, විභාග සහ පොත්පත් පරික්ෂා කිරීම හා විමර්ශන වලදි සහ සමුපකාර සමිතිය ගණන් බේරා වසා දැම්මේදි සමුපකාර සමිති ප්‍රඥප්ති ,රීති , චක්‍රලේඛ, කාරක රීති මලාව පටහැනිව අයුරින් සමිති අරමුදල් ප්‍රයෝජනයට ගෙන ඇති අයගෙන් එම මුදල් ලැබිය යුතු අවස්ථාවක අදාල මුදල් අයකර කර ගැනීමට නිර්දේශ ඉදිරිපත් කිරීම.

17. සමිතියේ වර්ෂික දෙපාර්තමේන්තු විගණනය හා 46,47 වගන්ති යටතේ සිදු කරන විමර්ශන වල දී ලබා දී ඇති උපදෙස් සම්බන්ධයෙන් පසුගාමී ක්‍රියාමාර්ග ගැනීම සඳහා සමිතිය මෙහෙයවීම.

18. සෑම විගණන වාර්තාවක්ම සම්බන්ධයෙන්ම ප්‍රඥප්තියේ 45 වගන්තිය අනුව කටයුතු කිරීම හා ඒ අනුව විගණනයේදි අනාවරණය වූ අඩුපාඩු දැනුම් දීමෙන් අනතුරුව එම අඩුපාඩු නිවැරදි කරවා ගැනීම සඳහා සමිතිවලට මඟ පෙන්වීම් ලබා දීම.

එම්. ඒ. පි. ජයකොඩි
සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ත්‍රාර්
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

පිටපත් :

| | | | |
|---|---|---|---|
| i. | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් ( කොළඹ,ගම්පහ,කළුතර) | - | කරු.දැ.පි.හා අදාළ නිළධාරීන් දැනුවත් කිරීමට හා ප්‍රගතිය පරික්ෂා කර වාර්තා කිරීමට. |